# නිව්යෝක් නායකත්ව සමුළුවට ලංකාවෙන් දේශප්‍රිය

ලෝකයේ රටවල් 200 ක ජාතික නායකයන් 700 ක ගේ සහභාගිත්වයෙන් ඇමරිකාවේ නිව්යෝක් නුවර පසුගිය 26 د සිට 30 ද දක්වා පැවැති සමුළුවට සත්ගෝ අධ්‍යක්ෂ ජෙනරාල් ආචාර්ය දේශප්‍රිය එන්. විජේතුංග මහතාද සහභාගි විය.



මේ සමුළුවට සහභාගි වීම සඳහා විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ, ධීවර හා ජලජ සම්පත් ඇමැති මහින්ද රාජපක්ෂ යන මහත්වරු ද ඇරියුම් ලැබ සිටියහ.

සාමය, සමාදානය සහ මානව අභිවෘද්ධිය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ මූලධර්ම වලට අනුව ක්‍රියා කරන ජනතා එකතුවක් ලෙස හැඳින්විය හැකි 'සත්ගෝ හි අධ්‍යක්ෂ ජනරාල් වන ආචාර්ය දේශප්‍රිය එස්. විජේතුංග මහතා මහරිෂි කලමණාකරණ විශ්ව විද්‍යාලයේ උප සභාපති පාලක මණ්ඩල අධ්‍යක්ෂක වශයෙන් ද 'ලෝක සාමය සඳහා වන විශ්ව රාජධානියේ රාජ්‍ය ඇමැතිවරයකු ලෙසද ක්‍රියා කරයි.

අන්තර් සංස්කෘතීන් නිරූපණය කරන 'ජගත් ගම්මානයක්' ලංකාවේ ඉදිකිරීමට සැලසුම් කැර ඇති අතර මෙහි ආකෘතිය පසුගිය වසරේ එවකට කථානායක කේ.බී. රත්නායක මහතා විසින් විවෘත කරන ලදී.